# ශ්‍රී ලංකාවෙන් හමු වූ පැරණි නාණක

එච්.පී.එන්.ආර්. සෙනෙවිරත්න[23]

පුරාවිද්‍යාත්මක කැණීම් මඟින් හමුවන විවිධ වර්ග වලට අයත් පුරාවස්තු වෙන් වෙන් වශයෙන් වර්ග කර හඳුනාගනිමින් අධ්‍යයනය කිරිම පුරා වස්තු වර්ගීකරණය ලෙස හඳුන්වයි. අතීතයේ සිටි ජනයාගේ කලා කෞශල්‍යය ඔවුන්ගේ ශක්තිමත් දෑත් වලින් නිම කරන ලද ස්තූප, පිළිම, වැව්, අමුණු වැනි නිර්මාණ අපේ ඉතිහාසයේ විවිධ මං සලකුණු ලොවට හෙළි කරනු ලැබේ. මහා පරිමාණ නිර්මාණ අතර ලංකාවෙන් හමු වි ඇති නාණක ද වලට ප්‍රධාන තැනක් හිමි වේ. පුරාවිද්‍යා පර්යේෂණ තුළින් අනාවරණය කර ගන්නා පැරණීන්නන්ගේ විවිධ ක්‍රියාකාරකම් නිසා පොළොව මත සැගවුණු කාසි මඟින් පුරාණයේ පැවති කාසි නාමාවලි ගත කිරිමට මෙන් ම ඉතිහාසය අර්ථ දැක්විම සඳහා ද සපයන දායකත්වය අතිමහත් ය. ක්‍රිස්තු පූර්ව 3 වැනි සියවස වන විට ශ්‍රී ලංකාවේ කාසි භාවිතයේ ප්‍රභවය සිදුවිය. මෙම කාසි නිෂ්පාදනය ක්‍රමානුකූල ව සැලැස්මකට අනුගත වූ බව **රූපදක** (කාසි අධ්‍යක්ෂ) **රූපවාපර** (කාසි අනුමත කරන්නා ආදී කාසි නිෂ්පාදනයට අදාළ තනතුරු නාමයන් සෙල් ලිපිවල සඳහන් විමෙන් පැහැදිළි වෙයි. ශ්‍රී ලංකාවේ කාසි සංසරණය පිළිබඳ ව දැනට සොයා ගෙන ඇති පැරණිතම ලිඛිත සඳහන හමු වන්නේ ද මේ ලෙන් ලිපි ආශ්‍රයෙනි. ලාංකිකයන් දේශීය මෙන් ම විදේශීය වෙළඳාමට අවතිර්ණ විම කාසි සංසරණයේ ආරම්භයට හා වර්ධනයට බලපෑ ප්‍රබල සාධකයක් විය.අතීතයේ භාවිත කාසි මඟින් සමකාලීන සමාජීය තොරතුරු රැසක් ද අනාවරණය කර ගැනීමට හැකි ය. පූරාණ ශ්‍රී ලංකාවේ පැවති කාසි වර්ග මේ වනවිටත් භාවිත කාලරාමුවක් අනුව දේශිය හා විදේශීය කාසි යනුවෙන් වෙන වෙන ම හඳුනාගෙන පෙළගස්වා තිබේ. දේශිය කාසි, ලෝහ නිෂ්පාදනයත් සමඟ හුවමාරු මාධ්‍යයක් ලෙස විවිධ හැඩතල වලින් යුත් ලෝහ කැබලි භාවිත කරන්නට යොමු වි තිබේ. පසු ව ක්‍රමවත් හැඩයකින් යුත් කාසි බිහි විය. **හස් එබු කාසි, ස්වස්තික කාසි, ඇතා සහිත ස්වස්තික කාසි, ගස සහිත ස්වස්තික කාසි, සහිත ස්වස්තික කාසි, සිංහ කාසි ,වෘෂභ කාසි ,ලක්ෂ්මි කාසි,රත්කහවනු ,අඩකහවනු, දෙඅක, අක, මධ්‍යකාලීන මස්ස, අඩමස්ස, යාපනයේ සේතු කාසි ,පනම,අගුටු මස්ස කොකු** කාසිය යන කාසීන් දැකවිය හැකි වේ. විදේශිය කාසි, ශ්‍රී ලංකාවේ අතීතයේ පටන් ම පෙරඅපර දෙදිග වෙළඳ මධ්‍යස්ථානයක් විය. වෙළඳ කටයුතු මෙන් ම රාජ්‍යතාන්ත්‍රික සබඳතාව සංචාරක කටයුතු හා අධිරාජ්‍යවාදී ආක්‍රමණ මත නිරන්තරයෙන් විදේශීය බලපෑම ලක්විය.ලංකාවේ නොයෙක් ප්‍රදේශ වලින් හමුවන කාසි වලින් මේ බව තහවුරු වේ. රෝම කාසි සොළි පාණ්ඩ්‍ය කාසි චෝල, පල්ලව චීන, අරාබි, පගෝඩ් කාසි මේ අතර වේ. මේවා සංරක්ෂණයේ දී විවිධ ක්‍රම වේද භාවිත කර තිබේ. කාසි ලියාපදිංචි කිරිම,වර්ගීකරණය,ගබඩා කිරීම, විශ්ලේෂණය අවසන් වාර්තා සැකසිම මූලික පියවර භාවිතා කරනු ලබයි. මෙසේ සඳහන් කරුණු අනුව නාණක විද්‍යාව වැදගත් විෂයක් ලෙස ගම්‍ය වේ.

ප්‍රමුඛ පද : නාණක විද්‍යාව, සංරක්ෂණය, කාසි

[23] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, nadeesharukshani09@gmail.com.